රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.04.30**

**නිවේදන අංකය: 406/2021**
**නිකුත් කළ වේලාව:21:00**

**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)**
**ප්‍රවෘත්ති කර්තෘ**

**අද කොවිඩ් මරණ 11ක්**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 11 ක් අද (30) තහවුරු කරන ලද අතර ඒ අනුව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන මුළු කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ සංඛ්‍යාව 678 කි.

01. පිළියන්දල ප්‍රදේශයේ පදිංචි 79 හැවිරිදි කාන්තාවකි. 2021 අප්‍රේල් 30 වන දින කොළඹ පෞද්ගලික රෝහලකට ඇතුළත් කරන අවස්ථාව වන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.
02. දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ පදිංචි 76 හැවිරිදි පුරුෂයෙකි. පොළොන්නරුව මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 අප්‍රේල් 30 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් ආසාදනය සහ උග්‍ර හෘදයාබාධ තත්ත්වයයි.
03. මාතලේ ප්‍රදේශයේ පදිංචි 67 හැවිරිදි කාන්තාවකි. මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 අප්‍රේල් 29 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් පුප්ඵුශීය සින්ඩ්‍රෝමයයි.
04. කළුතර ප්‍රදේශයේ පදිංචි 82 හැවිරිදි පුරුෂයෙකි. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර ඉංගිරිය මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 අප්‍රේල් 30 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.
05. වත්තල ප්‍රදේශයේ පදිංචි 53 හැවිරිදි පුරුෂයෙකි. කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසුව කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 අප්‍රේල් 29 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව සහ ශ්වසන පද්ධතියේ ආසාදනයයි.
06. දිවුලපිටිය ප්‍රදේශයේ පදිංචි 51 හැවිරිදි පුරුෂයෙකි. 2021 අප්‍රේල් 29 වන දින නිවසේදී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් 19 ආසාදනය සමඟ සංකීර්ණ වූ නිධන්ගත අක්මා රෝගයයි.
07. පැපිළියාවල ප්‍රදේශයේ පදිංචි 77 හැවිරිදි පුරුෂයෙකි. වතුපිටිවල මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටන අතර 2021 අප්‍රේල් 30 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් 19 ආසාදනය සමඟ ඇති වූ නියුමෝනියා තත්ත්වයයි.
08. අනුරාධපුර ප්‍රදේශයේ පදිංචි 64 හැවිරිදි කාන්තාවකි. අනුරාධපුර ශික්ෂණ රෝහලේ සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසුව නොච්චියාගම දිස්ත්‍රික් රෝහල වෙත ද පසුව අනරාධපුර මෙත්සිරි සෙවණ ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත ද මාරු කර යවා ඇති අතර එම ප්‍රතිකාර මධ්‍යස්ථානයේදී 2021 අප්‍රේල් 30 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව සමඟ ඇති වූ උග්‍ර ශ්වසන අපහසුතා සින්ඩ්‍රෝමයයි.
09. කොළඹ 14 ප්‍රදේශයේ පදිංචි 94 හැවිරිදි පුරුෂයෙකි. 2021 අප්‍රේල් 28 වන දින නිවසේදී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.
10. පරගස්තොට ප්‍රදේශයේ පදිංචි 65 හැවිරිදි පුරුෂයෙකි. 2021 අප්‍රේල් 28 වන දින කළුතර මහ රෝහල වෙත ඇතුළත් කරන අවස්ථාව වන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ ලේ විෂවීම, කොවිඩ් 19 ආසාදනය සහ හෘද රෝගී තත්ත්වයයි.
11. කැලණිය ප්‍රදේශයේ පදිංචි 46 හැවිරිදි කාන්තාවකි. 2021 අප්‍රේල් 27 වන දින කොළඹ ජාතික රෝහලට ඇතුළත් කරන අවස්ථාව වන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ උග්‍ර ශ්වසන අපහසුතා සින්ඩ්‍රෝමය සහ කොවිඩ් නියුමෝනියාවයි.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை மாவத்தை, கொழும்பு 05, இலங்கை.
(+94 11) 2515759
(+94 11) 2514753
www.news.lk